# ආගමන විගමන දෙපාර්තමේන්තුව

## මාර්ගගතව විදේශ ගමන් බලපත්‍රය ඉල්ලුම් කිරීම

**අයදුම් කරන්නේකෙසේද?**

- ඔබට හදිසි සේවය හෝ කඩිනම් සේවය සඳහා අයදුම් කල හැකිය.
- හදිසි සේවය තෝරා ගනු ලබන්නේ නම්, ඔබගේ ඇඟිලි සලකුණු ලබාදී දින 3 කට පසුව ඔබගේ ගමන් බලපත්‍රය නිතුත් කරනු ලැබේ.
- සාමාන්‍ය සේවය තෝරා ගනු ලබන්නේ නම්, ඔබගේ ඇඟිලි සලකුණු ලබාදී දින 12 කට පසුව ඔබගේ ගමන් බලපත්‍රය නිකුත් කරනු ලැබේ.

**සුදුසුකම්**

- අයදුම්පත ඉදිරිපත් කරන දිනට ඔබගේ වයස අවුරුදු 15 ට වැඩි විය යුතුය.
- ඔබ දැනටමත් විදේශ ගමන් බලපත්‍රයක් ලබාගෙන ඇත්නම් එය ඔබ සතු විය යුතුය.

පහත ලිපි ලේඛන වල මුල් පිටපත් තිබිය යුතුව

- ජාතික හැඳුනුම්පත (NIC)
- උප්පැන්න සහතිකය
- විවාහ සහතිකය (අවශ්‍ය වන්නේ නම්)
- ද්විත්ව පුරවැසි සහතිකය (අවශ්‍ය වන්නේ නම්)
- විදේශ ගමන් බලපත්‍රය (තිබේ නම්)

අයදුම්පත් ගාස්තු

- හදිසි සේවය සඳහා රු. 15000/=
- සාමාන්‍ය සේවය සඳහා රු. 5000/=
- ඡායාරූප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ඒකකයෙන් ලබා ගන්නේ නම් ඒ සඳහා රු. 350/=
- අයදුම්පත් ගාස්තු මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ ගෙවන්නේ නම්, ඔබට වලංගු හර/බැර කාඩ්පතක් තිබිය යුතුය.නොඑසේ නම් ඔබට බැංකුව්දී ගෙවීමට (Pay at Bank) තේරීම් විකල්පය ඇත.
- එබ බැංකුව්දී ගෙවීමට (Pay at Bank) විකල්පය තෝරා ගන්නේ නම්, පලමුව ඔබ රිසිට්පත භාගත කර, එය මුද්‍රණය කරගෙන ගෙවීම සඳහා ලගම ඇති ලංකා බැංකු (BOC) ශාඛාව වෙත යා යුතුයි.

උපදෙස්

- කරුණාකර පහත සඳහන් **URL** වෙත පිවිසෙන්න. [https://www.immigration.gov.lk/](https://www.immigration.gov.lk/)
- අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කල යුතුය.
- හදිසි සේවා අයදුම්කරුවන්ට කුරියර් සේවාව මගිනුත්, සාමාන්‍ය සේවා අයදුම්කරුවන්ට ලියාපදිංචි තැපෑලෙනුත් විදේශ ගමන් බලපත්‍රය යොමු කරනු ලැබේ.
- ඔබට ඡායාරූපාගාරයකින් හෝ ඇඟිලි සලකුණු ලබා දෙන අවස්ථාවේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ ශාඛා කාර්යාලයෙන් ඡායාරූපය ලබා ගත හැක.
- අවශ්‍ය සියලුම මෘදු පිටපත් **JPEG** අකෘතියෙන් තිබිය යුතු අතර ප්‍රමාණය **5MB** ට වඩා අඩු විය යුතුය.

තෝරාගත් සේවා ස්ථානයේදී පහත තොරතුරු ඉදිරිපත් කල යුතුය.

- ඔබගේ ඇඟිලි සලකුණු
- ඔබගේ අත්සන
- ඔබගේ ඡායාරූපය (එම අවස්ථාවේදීම ඡායාරූප ලබා ගත හැකිය)

අයදුම්පත යොමු කරන අවස්ථාවේදී, "වෙලාව වෙන් කරගැනීමේ නිවේදනයක්" ,කෙටි පණිවිඩයක් හා අයදුම්පත් යොමු අංකය ඔබගේ ජංගම දුරකථනයට ලැබෙනු ඇත.

ඔබගේ අයදුම්පත දෙපාර්තමේන්තුව විසින් පිළිගත් වහාම, ප්‍රාදේශීය කාර්යාලයට යායුතු දිනය හා වේලාව දන්වා කෙටි පණිවිඩයක් ලැබෙනු ඇත. ප්‍රාදේශීය කාර්යාලයට යන විට පහත ලේඛන රැගෙන යා යුතුයි.

- දිනය හා වේලාව වෙන් කර ගත් කෙටි පණිවිඩය (**SMS**)
- ජාතික හැඳුනුම්පත (**NIC**)
- උප්පැන්න සහතිකය
- විදේශ ගමන් බලපත්‍රය (තිබේ නම්)

අයදුම් කිරීම සඳහා කොන්දේසි

- ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු අතර දැනට ලංකාවේ පදිංචිව සිටිය යුතුයි.
- ඔබට වලංගු ජංගම දුරකථන අංකයක් හා විද්‍යුත් තැපැල් ලිපිනයක් තිබිය යුතුයි.
- ඔබගේ විදේශ ගමන් බලපත්‍රය නැති වී ඇත් නම්, ඔබ ආගමන විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රාදේශීය කාර්යාලයක් වෙත පැමිණීම අනිවාර්යය වේ.

වයස සීමාවට අදාලව අයදුම්කරන ආකාරය

- අවුරුදු 15 අඩු අයදුම්කරුවන්, ආගමන විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රාදේශීය කාර්යාලයක් වෙත පැමිණිය යුතුය.
- අවුරුදු 15 ත් 60ත් අතර අයදුම්කරුවන් ට ඉහත ක්‍රමවේදය මගින් අයදුම් කල හැකිය.
- අවුරුදු 60 ට වැඩි අයදුම්කරුවන්ට, ඡායාරූප රිසිට්පත ඡායාරූපාගාරයෙන් ලබා ගෙන අත්සන් ආකෘතිය භාගත කර, අත්සන යෙදීමෙන් පසු සෘජුවම පද්ධතියට ඇතුලත් කල හැකිය. ඔවුන්ගේ ඇඟිලි සලකුණු ලබා දීමට අවශ්‍ය නොවේ.